www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමුලුව අද්දර දී ජී-20 කන්ඩායම තුල පවතින මතභේද එලිමහනට එයි

## Divisions in G-20 open on summit eve

2010 ජූනි 24

සති අන්තයේ ටොරොන්ටෝවේ පැවැත්වීමට නියමිත ජී-20 නායක සමුලුව සඳහා ලක ලෑස්ති වන අතරතුරේ ප්‍රධාන ධනපති බලවතුන් අතර පවතින සැලකිය යුතු මතභේද එලිමහනට විත් ඇත.

නොඑකඟතාවන් මතු වී තිබෙන්නේ කාරනා දෙකක් වටා ය. එකක් නම්, ආර්ථික වර්ධනය ඉහල දමා ගැනීමේ අරමුනෙන් රාජ්‍ය මූල්‍යයේ උත්තේජක පියවරයන් අඛන්ඩව යොදා ගැනීම යි. අනෙක නම්, විශාල අපනයන අතිරික්තයන් සහිත රටවල් - විශේෂයෙන් ම චීනය සහ ජර්මනිය - තම දේශීය පරිභෝජනය පුලුල් කිරීමට සහ ඒ හරහා ගෝලීය ඉල්ලුම ඉහල දැමීමට මීට වඩා වැඩි යමක් කල යුතු යැයි එක්සත් ජනපදය කරන බලපෑමයි.

පසු ගිය දින කිහිපය පුරා වොෂින්ටනය සහ බර්ලිනය නිකුත් කල ප්‍රකාශවලින් ගැටුමේ සැර බාල කිරීමට උත්සාහ දැරුනි. එක් වාර්තාවක සඳහන් වූ පරිදි, සමුලුව "සෝෂාකාරී තරගයක්" බවට පත් වීම වැලැක්වීමට තැත් කල ද, මතභේද දැඩිව මුල්බැස තිබේ.

මතභේද පලමුව එලිමහනට පැමිනියේ ජූනි 4-5 දෙදින පැවැත්වුනු ජී-20 කන්ඩායමේ මුදල් ඇමතිවරුන්ගේ රැස්වීමේ දී එහි අවසන් නිල නිවේදනය නිකුත් කෙරුනු විට ය. සමුලුව ආරම්භයේ දී පැවති අපේක්ෂාවන්ට පටහැනිව යමින් එය අවධාරනය කලේ, ආර්ථික වර්ධනයට රුකුල් දීම සඳහා අවශ්‍ය වන්නේ ආදායම ඉහල නැංවීමේ අරමුනෙන් ආන්ඩුව ක්‍රියාවට නගන පියවරයන් නොව, ආන්ඩුවේ නය හා හිඟ අඩු කර ගැනීම බව යි. නිවේදනයේ ස්වරයෙහි පැවතුනු වෙනසින් පිලිබිඹු වූයේ යුරෝපය තුල පවතින "රාජ්‍ය නය" අර්බුදයේ බලපෑම යි. එය, ලේමන් බ්‍රදර්ස් බිඳ වැටීමත් සමග හට ගත්තාටත් වඩා බරපතල මූල්‍ය අර්බුදයක් පැන නැගීමේ තර්ජනය මතු කලේ ය.

යුරෝපා ආන්ඩු "යුරෝ අර්බුදය" තේරුම් ගෙන ඇත්තේ මූල්‍ය වෙලඳ පොල ක්‍රියාකාරිත්වය නිසා ඇති වූවක් ලෙස ය. 2008 සැප්තැම්බරයේ දී ගෝලීය මූල්‍ය අර්බදය පුපුරා යාමෙන් පසුව දරන්නට සිදු වුනු දැවැන්ත නය ආපසු අයකර ගැනීම තවත් පමා කල නොහැකි විය. කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් විශාල ලෙස පහත දැමීම ඉලක්ක කර ගත් කප්පාදු වැඩ සටහන් මාලාවක් වහා ම දියත් කිරීමට සිදු විය.

කෙසේ වුව ද මෙම හැරීම නිසා යුරෝපීය වෙලඳ පොලවල් නිසරු තත්ත්වයට පත් වුව හොත්, එක්සත් ජනපද අපනයන ඉහල දැමීමෙන් ඇමරිකාවේ ආර්ථික තත්ත්වය ප්‍රකෘතිමත් කර ගැනීමට තමන් දරන ප්‍රයත්නයන් අනතුරට පත් වනු ඇතැයි, ඔබාමා පාලනාධිකාරය කනස්සල්ලට පත්කලේය. එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් තිමොති ගයිත්නර් මුල දී යැවූ ලිපියකින්, යුරෝපය තුල සිදු වන "ප්‍රතිපත්තිමය සීරුමාරු කිරීම්" නිසා "ප්‍රකෘතිමත් වීමේ වේගයට හානි විය" හැකි බවට බිය පල විය. ජී-20 කන්ඩායමේ නායකයන් වෙත පසු ගිය සතියේ ලිපියක් යවමින් ජනාධිපති ඔබාමා ප්‍රකාශ කලේ, ටොරොන්ටෝවේ දී "ඉහල ම ප්‍රමුඛතාව" දිය යුත්තේ "ප්‍රකෘතිමත් වීම ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම" සඳහා බව යි.

"සමතුලිත ගෝලීය ඉල්ලුම මත බලගතු සහ තිරසාර ගෝලීය ප්‍රකෘතිමත් වීමක් ඇති කල යුතු යි" ඔහු ලිවී ය. "ජී-20 කන්ඩායමට අයත් හැම ආර්ථිකයක ම සැලකිය යුතු දුර්වලතා පවතී. දැනට මත් විශාල වෙලඳ අතිරික්තයන් සහිත ඇතැම් රටවල පෞද්ගලික අංශයේ ඉල්ලුම දුර්වල වීම සහ එම රටවල් දිගින් දිගට ම දැඩි ලෙස අපනයන කෙරෙහි විශ්වාසය තබා සිටීම ගැන මම උත්සුක වී සිටිමි.... බාහිර අතිරික්තයන් සහිත රටවල් දේශීය වර්ධන මූලාශ්‍ර ශක්තිමත් කළ යුතු බවට පිට්ස්බර්ග්හි දී [2009 සැප්තැම්බරයේ දී පැවැත්වුනු ජී-20 කන්ඩායමේ නායකයන්ගේ රැස්වීමේ දී] අපි එකඟතාවකට පැමිනියෙමු."

මෙය ලෝක ආර්ථිකය තුල සිටින

විශාලතම අපනයන ජාතීන් දෙක වන ජර්මනිය සහ චීනය ඍජුව ම ඉලක්ක කර ගෙන කල සැඳහුමක් විය. මීට ප්‍රතිචාර දැක්වූ චීනය ජූනි 19 දා නිවේදනය කලේ, අනුපිලිවෙලින් බලයට පත් ඇමරිකානු පාලනාධිකාරයන් දිගු කලක් තිස්සේ ඉදිරිපත් කරන කැපී පෙනෙන ඉල්ලීමට එකඟ වෙමින්, එක්සත් ජනපද ඩොලරයට අවකාශ සැලසෙන පරිදි සීරුමාරු වීමට යුආන් මුදලට ඉඩ දෙන අතර, තම රට තම ව්‍යවහාර මුදල සම්බන්ධයෙන් වඩා නම්‍යශීලී පිලිවෙතක් අනුගමනය කරන්නට යන බව යි. සීමිත ව්‍යවහාර මුදල යලි තක්සේරු කිරීම සඳහා සීමිත ඉඩකඩක් ලබා දීමෙන් චීන පාලන තන්ත්‍රය බලාපොරොත්තු වන්නේ ටොරොන්ටෝවේ දී එල්ල විය හැකි ප්‍රහාරයෙන් බේරීමට යි.

ඔබාමාගේ ලිපියට ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කල්ගේ ආන්ඩුවෙන් ලැබුනේ වෙනස් ප්‍රතිචාරයකි. ඇය සහ ඇගේ ඇමතිවරු, ඊලඟ වසර හතර තුල දී යුරෝ බිලියන 80කින් වියදම් කැපීමේ සිය වැඩ සටහනට මුල පිරීමට තම ආන්ඩුව ගත් තීන්දුව ප්‍රසිද්ධියේ ම ආරක්ෂා කිරීමට පියවර ගත්හ.

සඳුදා වාර්තාකරුවන් හමුවේ කතා කල මර්කල් මෙසේ පැවසුවා යː "අපි තිරසාර වර්ධනයක් වෙනුවට යලි වතාවක් නිකම් ම නිකම් පුම්බන ලද වර්ධනයක් අත් කර ගත්තොත් අපට තවත් අර්බුදයකින් එයට වන්දි ගෙවීමට සිද්ධ වනු ඇත." මුදල් ඇමති වුල්ෆ්ගැන්ග් ෂවුබල් ඇයට සහාය දෙමින් මෙසේ පැවසුවේ යː "යුරෝපය තුල පමනක් නොපවතින පමන ඉක්මවා ගිය රාජ්‍ය අයවැය හිඟයන් [මෙය එක්සත් ජනපදය ගැන ඉඟි කරමින් කල සැඳහුමක් විය] මෙම අර්බුදයේ එක් ප්‍රධාන හේතුවක් නොවන බවට කිසිවෙකුටත් බැරෑරුම්ව තර්ක කල නොහැකිය. මේ නිසයි අපට ඒවා කපා හරින්න සිද්ධ වෙලා තියෙන්නෙ." ජර්මනිය පිට්ස්බර්ග්හි දී ඇති කර ගත් එකඟතාවන් අත් හැර දමමින් සිටින බවට එල්ල වුනු විවේචනාත්මක ඉඟිය ෂවුබල් ප්‍රතික්ෂේප කලේ ය. ඔහු මෙසේ අවධාරනය කලේ යː "අපි ජාත්‍යන්තර විවාදයට මුහුන දෙනවා, මං හිතන්නෙ අපිට පුලුවන් විශාල ආත්ම විශ්වාසයකින් යුතුව ඒකට මුහුන දෙන්න."

ජර්මානු ආර්ථික ඇමති රයිනර් බ්‍රැඩෙර්ලි ඊටත් වඩා ඍජු ලෙස අදහස් දැක්වී ය. "රාජ්‍ය අයවැය ආපහු සමතුලිතතාව කරා ගෙන ඒමට නම් මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම නොකර ම බැරි දෙයක්, මෙය අපගේ ඇමරිකානු මිතුරන්ට අප විසින් කිව යුතු දෙයකි" ඔහු පැවසී ය.

යුරෝපා මහ බැංකුවේ සභාපති ජීන්-ක්ලෝඩ් ට්‍රිචට් ජර්මානු ආන්ඩුවට සහාය පල කලේ ය. සඳුදා රාත්‍රියේ යුරෝපා පාර්ලිමේන්තුව හමුවේ කල කතාවක දී ඔහු පැහැදිලිව ම කියා සිටියේ, කප්පාදු වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට හේතු වූයේ යුරෝපා මූල්‍ය වෙලඳ පොලවලින් කෙරුනු ඉල්ලීම් බව යි. විශ්වාසය යලි ගොඩ නැගීම සඳහා ආන්ඩුවේ වියදම් කැපීම අත්‍යවශ්‍ය විය. ඔහු කතා කලේ "එක් අතකින් බලන විට බාධාකාරී යැයි ඔබ විස්තර කරන්න ඉඩ තිබෙන නමුත් සැබවින්ම නම් විශ්වාසය ගොඩ නැගීම යැයි හැඳින්විය හැකි පිලිවෙතක්" - අයවැය ප්‍රතිපත්තියක් පිලිබඳව ය. රාජ්‍ය මූල්‍යය ගමන් කරන්නේ තිරසාර විය නොහැකි මගක නම් "ප්‍රතිලාභ ලැබීමේ දී තමන්ට දුෂ්කරතාවක් ඇති විය හැකි බව ආයෝජකයන් දැන ගන්නවා."

අඩු ගනනේ එලිපිට ඍජු ඝට්ටනයක් ඇති නො වී ටොරොන්ටෝ රැස්වීම පැවැත්වෙනු ඇතැයි අපේක්ෂා කල ද යටින් පවතින මතභේද විසඳෙනු නැත.

බුෂ් පාලනාධිකාරය යටතේ ජී-20 කන්ඩායමේ නියෝජිතයෙකු ලෙස සිටි ඩැන් ප්‍රයිස් *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතට කතා කරමින්, ප්‍රධාන බලවතුන් අතර වැඩෙන නොඑකඟතාවන් පෙන්වා දුන්නේ ය. "රටවල් එන්ට එන්ට ම තම තමන්ගේ මාවත් තෝරාගැනීමත් සමඟ පසු ගිය සමුලුවල ආවේනික ලක්ෂනය හා ඒවායේ ඵලදායී බවේ මූලාශ්‍රය හැටියට පැවතුනු ජී-20 කන්ඩායමේ එක්සත්කම පිලිබඳ කාරනය දුර්වල වෙන්ට පටන් අර ගෙන තිබේ." ඔහු පැවසී ය. "කලින් පවත්වපු ජී-20 කන්ඩායමේ කිසි ම සමුලුවක දී අනෙක් රටවල්වල අඩුලුහුඬුකම් දෙසට අවධානය මාරු කිරීමට උත්සාහ කරමින් මේ තරම් නායකයො ගනනක් මේ තරම් ලිපි ගනනක් ලියා නැහැ."

සමුලුවේ ක්ෂනික ප්‍රතිඵලය කුමක් වුවත්, ගැටුම් තීව්‍ර වන බව නම් නිසැක ය. ජූනි 15 දා පල කල විවරනයක දී (මෙය රාජ්‍ය මූල්‍යය සම්බන්ධයෙන් කප්පාදු පිලිවෙතක් අනුගමනය කිරීමට ඉතා ඉක්මන් පරිශ්‍රමයක් දැරීමෙන් ඇති විය හැකි අනතුරු කෙරෙහි අවධානය යොමු කිරීමට රචිත ලිපි පෙලකින් එකකි) *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ තීරු ලිපි රචකයෙකු වන මාර්ටින් වුල්ෆ් අනතුරු ඇඟවමින් කියා සිටියේ, යුරෝ කලාපය "දැවැන්ත ජර්මනියක්" බවට පරිවර්තනය වීම "එක්සත් ජනපදය එල්ල කර ගෙන කෙරෙන වානිජ යුද්ධයක කොටසක්" ලෙස දකින්නට ඉඩ තිබෙන බව යි. "පසුව කී රට [එක්සත් ජනපදය] අතිරික්ත සහිත රටවල - එනම්, තම රටවල අතිරික්තයන් ඇති වීම නොවැලැක්විය හැකි දෙයක් බවට පත් කල හිඟයන් සම්බන්ධයෙන්

නයගැතියන්ට දොස් පවරන අතිරික්ත සහිත රටවල - කුහකකම ඉවසා සිටිනු ඇත්තේ කොතරම් කාලයකට ද? මගේ අනුමානය නම් වැඩි කලකට නො වේ...."

හේතු යුක්තිය දැකීමට ලෝක නායකයන් පොලඹවා ගත හැකි වුව හොත් නම් ධනවාදය තාර්කික කලමනාකරනයකට යටත් කල හැකි යැයි ය යන පලක් නැති විශ්වාසයෙන් "මධ්‍යම ප්‍රතිපදාව" සොයා යන වුල්ෆ්, කෙටි කාලීන පියවරයන්ගෙන් බලගතු වර්ධනයක් ඇති කර ගෙන දිගු කාලීන පියවරයන්ගෙන් දැවැන්ත හිඟයන් සීමා කර ගැනීම ඉල්ලා සිටියේ ය.

කෙසේ වුව ද, අවසාන විග්‍රහයේදී, මතභේද වූ කලි ආන්ඩුවලට තාර්කික පිලිවෙත් අනුගමනය කිරීමට බැරිකමේ නිෂ්පාදනයක් නො වේ. ඒ වෙනුවට ඒවායින් ප්‍රකාශයට පත් වන්නේ ගෝලීය ධනපති ක්‍රමය තුල පවතින මූලික සහ නොවිසඳිය හැකි වෛෂයික ප්‍රතිවිරෝධතාවන් ය - සියල්ලට මත් වඩා සමස්තයක් ලෙස ගත් ලෝක ආර්ථිකය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවතින ප්‍රතිවිරෝධය යි. අර්බුදයකට මුහුන පෑ කල, සෑම ධනපති බලවතෙකු ම වෙලඳ පොලවල් සහ ලාභ සඳහා කරන සටනේ දී තම ප්‍රතිවාදියාගේ වියදමින් තමන්ගේ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට උත්සාහ දැරීම තුලින්, එකිනෙකා අනෙක් සියල්ලන්ට එරෙහි අරගලයකට තල්ලු කිරීමට මග පාදයි.

මෙහි අර්ථය වන්නේ, ප්‍රමාදවී නො ව ලඟ දී ම, මෙම සති අන්තයේ පැවැත්වීමට නියමිත ජී-20 කන්ඩායමේ සමුලුවට කලින් සිදු වන මේ "වාග් යුද්ධය" මීට වඩා බෙහෙවින් බරපතල ආර්ථික, සහ මිලිටරිමය පවා වන, ගැටුම්වලට මග පාදන බව යි.

නික් බීම්ස්

© www.wsws.org